නිපුණතාව: 10.:-හවුල් ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි .

නිපුණතා මට්ටම: 10.4-හවුල් ව්‍යාපාරයක ආදායම් ප්‍රකාශනය පිළියෙල කර ,හවුල්කරුවන් අතර ලාභාලාභ විසර්ජනය කරයි .

හවුල් ව්‍යාපාරයක අයිතිය කිහිපදෙනකු සතු වන නිසා ශුද්ධ ලාභය හවුල්කරුවන් අතර විසර්ජනය කළ යුතුය.හවුල් ගිවිසුමට අනුව ගිණුම් කාලච්ඡේදයට අදාළ වූ ප්‍රාග්ධන පොලී , හවුල් වේතන,ලාභ/ අලාභ කොටස් ලාභ ලාභ විසර්ජන ප්‍රකාශයට ඇතුළත් කරයි .

5:3:2 අනුපාතයට ලාභ ලාභ බෙදා ගත් ABC හවුල් ව්‍යාපාරයේ 2020/03/31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉපයූ ශුද්ධ ලාභය රු.513 000 කි.

හවුල් ගිවිසුම පහත දැක්වේ.

1. යෙදවූ ප්‍රාග්ධනය මත 10% වාර්ෂික පොලියක් හවුල්කරුවන් ට හිමිවේ.
2. A ට මසකට රු.2 000 ක් ද B ට අර්ධ වාර්ෂිකව රු.15 000 ක් ද ක් C ට වාර්ෂිකව රු 24 000 ක් ද හිමි වීම.
3. 2019/04/01 දිනට ABC ව්‍යාපාරයේ ප්‍රාග්ධන ගිණුම් ශේෂ පිළිවෙලින් රු.400 000, රු.350 000 හා රු. 200 000 වේ.

අවශ්‍ය වන්නේ,

1.ලාභ ලාභ විසර්ජන ගිණුම 2.හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්